**කුලියාපිටිය නගර සභාව - 2022**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කුලියාපිටිය නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඇතුළත්ව එහි ක්‍රියාකාරීත්වය පිළිබඳව නගර සභා ආඥා පනතේ (255 අධිකාරිය) 181 (I) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (I) උපවගන්තියේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කුලියාපිටිය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | -------------------------- | ------------- |
| (අ) | අපහරණය කරන ලද පුස්තකාල පොත් 318ක වටිනාකම රු.43,600 ක් පුස්තකාල පොත් ගිණුමින් ඉවත්කර නොතිබුණි. | ගිණුම්ගත කිරීම සඳහා ඉදිරියේදී කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති කොම්පෝස්ට් පොහොර කිලෝග්රෑම් 9,495 ක වටිනාකම වූ රු.1,113,940 ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ වාර්ෂික ගිණුම් සකස් කිරීමේදී අවශ්‍ය කටයුතු සිදු කරන බව. | -එම- |
| (ඇ) | 2022 දෙසැම්බර් 31 දිනට දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය ශේෂය රු.9,682,040 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ණය ශේෂය නිවැරදි කිරීමට අදාල කටයුතු සිදු කරන බව. | -එම- |

### 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | -------------------------- | ------------ |
| ගිණුම් විෂයයන් 2ක මූල්‍ය ප්‍රකාශන අනුව එකතුව හා උප ලේඛන අතර එකතුව අතර වටිනාකම රු.28,760,311ක වෙනසක් විය. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් සකස් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

රෙගුලාසි වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ---------------------- | --------------------------- | ------------------------- | ------------------- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | 2022 දෙසැම්බර් 31 දිනට අවස්ථා 587 කට අදාළ රු.8,755,545 ක කල් ඉකුත් වූ තැන්පතු නියාදනය කර නොතිබුණි. | දීර්ඝ කාලීනව බදු දෙනු ලබන දේපලවල තැන්පත් නිදහස් කිරීමට නොහැකි අතර හඳුනාගත් අනෙකුත් නිදහස් කිරීමට මේ වන විටත් කටයුතු කරමින් පවතින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,134,250 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.27,042,883 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැ. 31ට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල අදායම | රැස්කල අදායම | දෙසැ. 31ට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් බදු | 28,674 | 267,357 | 26,867 | 28,195 | 28,742 | 27,993 | 19,181 | 29,620 |
| කුලී | 216,636 | 21,064 | 20,059 | 3,197 | 111,505 | 14,428 | 13,641 | 2,440 |
| බලපත්‍ර ගාස්තු | 17,930 | 12,196 | 12,088 | - | 17,451 | 7,599 | 7,599 | - |
| වෙනත් ආදායම් | 44,814 | 123,022 | 295,935 | 14,008 | 36,783 | 114,466 | 94,768 | 15,816 |
| එකතුව | 308,054 | 423,639 | 354,949 | 45,400 | 194,481 | 164,486 | 135,189 | 47,876 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------- | ------------ |
| **වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.15,768,510 ක් වසරකට වැඩි කාලයක සිට හිඟව පවතින වරිපනම් බදු අයකරගෙන නොතිබුණි. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කර ඇති බව දන්වා සිටින බව. | පනතේ විධි විධාන අනුව හිඟ ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ---------------------------- | --------------- |
| **අතුරු ව්‍යවස්ථා** | | |
| නගර සභා ආඥා පනතේ 157 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පැනවිය හැකිව තිබූ නමුත්,2022 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු කාරණාවක් වෙනුවෙන් සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | 2022 වර්ෂයේ ජංගම වෙළඳාම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාවක් කෙටුම්පත් කර ඇති බව. | සභාවට අදාළව අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කුලියාපිටිය නගර සභාව විසින් ඉදිකරනු ලබන නව පොදු වෙළඳපල සහ බහු කාර්යය ගොඩනැගිල්ලේ ඉදි කිරීම් සම්බන්ධයෙන් කොන්ත්‍රාත් ආයතනය සමඟ ඇති කර ගත් ගිවිසුම අනුව 2020 ජූලි 06 දින සිට දින 540ක් ඇතුළත අදාළ කාර්යය නිමකළ යුතු වුවත් 2022 දෙසැම්බර් 31 දින වන විට එහි භෞතික ප්‍රගතිය සියයට 60 ක් හා මූල්‍ය ප්‍රගතිය සියයට 48 ක් විය. | රටේ පැවති අයහපත් ආර්ථික හා මූල්‍ය අර්බුදය හේතු වූ බව. | සැලසුම් කළ පරිදි කර්තව්‍යයන් නිම කළ යුතුය. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ------------------------ | ------------ |
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයිතම 15කට අදාළව ලැබිය යුතු ශේෂ එකතුව රු.45,495,973ක් පැවති අතර ඒ අතුරින් රු.4,123,716ක් වසර 1ත් 3ත් අතර කාල සීමාවකට අදාළ විය. | හිඟ මුදල් එකතු කිරීමේ කටයුතු කරමින් සිටින බව. | අදාළ ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් වර්ග 19කට අදාළව එකතු වටිනාකම් රු.185,607,950ක් පැවති අතර ඒ අතුරින් රු.4,977,779ක් වර්ෂ 5කට වඩා පැරණි ශේෂයක්ද රු.4,204,454ක් වසර 3ත් 5ත් අතර ශේෂයන් ද විය. | දීර්ඝ කාලීනව බදු දෙනු ලබන දේපලවල තැන්පත් නිදහස් කිරීමට නොහැකි අතර හඳුනාගත් අනෙකුත් තැන්පත් නිදහස් කිරීමට මේ වන විටත් කටයුතු කරමින් පවතින බව. | අදාළ ශේෂ කඩිනමින් නිරවුල් කළ යුතුය. |
| (ඇ) | 2022 දෙසැම්බර් 31 දිනට මුල්‍ය ප්‍රකාශන අනුව පොදු ගබඩා ගිණුමෙහි ශේෂය රු.43,298,299 ක් වුවද, වාර්ෂික සමීක්ෂණ වාර්තා අනුව ගණනය කර තිබූ ගබඩා ගිණුම් ශේෂය රු.14,799,988 ක් වූ අතර,ඒ අනුව පොදු ගබඩාවෙහි රු.28,498,311 ක වෙනසක් නිරීක්ෂණය විය. පොදු ගබඩාවෙහි තොග අඩුවීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | දීර්ඝ කාලයක් තිස්සේ සිදුවී ඇති විවිධ අඩුපාඩු නිසා මෙම වෙනස හටගෙන ඇත. ඉදිරියේදී නැවත පරීක්ෂාවකින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ප්‍රශස්ත ගබඩා පාලනයක් පවත්වාගත යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

**සේවක ණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | ------------------------ | -------------- |
| සේවකයින් 5 දෙනෙකුට අදාළව එකතුව රු.40,600ක් වූ අය නොවන සේවක ණය ශේෂයක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට පැවතුණි. | ඔවුන්ගේ ණය මුදල් ඇප කරුවන් ගෙන් අය කිරීමටත්, විශ්‍රාම පාරිතෝෂිතය ලද පසු සහ මරණ පාරිතෝෂිතය ලද පසු අය කිරීමට කටයුතු කරන බව. | හිඟ මුදල් නිරවුල් කර ගත යුතුය. |

**3.5 වත්කම් කළමනාකරණය**

**(අ) වත්කම් ලේඛනගත නොකිරීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබූ අතර මූල්‍ය ප්‍රකාශන උපලේඛනවල ඇතුළත් රු.12,758,900 ක් වූ වාහන 12ක් වත්කම් ලේඛනවල ඇතුළත් කර නොතිබුණි. | වත්කම් ලේඛන නිසිපරිදි යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව | වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වාගත යුතුය. |

**(ආ) පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් නඩත්තු කරන සුසාන භූමි 05ක් සහ ඉඩම් 05ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් පවරා ගෙන නොතිබුණි. | පවරා ගැනීම සඳහා අදාල කටයුතු සිදුකර ඇති බව. | වත්කම් නිසි පරිදි පවරාගත යුතුය. |

**(ඇ) නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අළුත්වැඩියා කටයුතු සඳහා 2019 වර්ෂයේ දී පෞද්ගලික ආයතනයක් වෙත ලබා දී තිබූ සභාවට අයත් බොබ් කැට් යන්ත්‍රය සමාලෝචිත වර්ෂය අවසාන වනවිට අළුත්වැඩියාව නිම කර නොතිබුණි. සභාව සතුව වාහන සහ යන්ත්‍රසූත්‍ර වත්කම් 03ක් නිශ්ක්‍රීයව පැවතුණි. | අත්ට්‍රැක්ටරය අපහරණය මගින් වෙන්දේසි කළත් ගැණුම් කරුවකු ඉදිරිපත් නොවීය. තණකොළ කපන ඇග්‍රිමේට් යන්ත්‍රය ඉදිරියේදී වෙන්දේසි කිරීමට නියමිත බව. | සභාව සතු වත්කම් ප්‍රශස්ත ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**අයවැය පාලන**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආදායම් විෂයයන් 7ක් අතුරින් 4කම අයවැයගත ආදායම හා සත්‍ය ආදායම අතර විචලතාවය සියයට 26.6 සිට 149 දක්වා පරාසයක පැවතුණු අතර වැය විෂයය භාණ්ඩ 09ක් අතුරින් 5ක අයවැයගත ප්‍රතිපාදනයෙන් සියයට 29 සිට 65 දක්වා ප්‍රතිපාදන ප්‍රමාණයක් වර්ෂය තුළ වැය නොදරා ඉතිරිව පැවතුණි. | නව බහුකාර්ය ගොඩනැගිල්ලේ ඉදිකිරීම් නිම නොවූ බැවින් ඇස්තමේන්තු කඩකුලී ආදායම හා සත්‍ය කඩකුලී ආදායමෙහි විශාල වෙනසක් පෙන්නුම් කිරීම මීට හේතු වූ බව. | තාත්විකව අයවැය පිළියෙල කිරීමට හා ප්‍රතිපාදන ප්‍රශස්තව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |